## අම්මා

මදක් අඩවන් දෙනෙත් දල්වන්
හිඩැස් වහලේ සිදුරු මැද්දෙන්
අහස දෙසට ම එබී බලමින්
නිසොල්මන් වී සුසුම්
හෙළමින්....

කුමක් නුඹ පැවසුවෙ ද අම්මා?

කඳුරැල් සඟවා
ලොව වෙත
පෑ
හසරැල් මට පුදුමෙකි

ඇගෙ නෙත් අගිස්සේ
බර වී තෙරපුණු
කඳුළැල්

කොට්ටය සිප ගත් මොහොතේ
ඒ කඳුළු බිඳුවේ බර
කොපමණ වේ දැ යි
කිරා බලන්නට
මට සිතුණා....

එච්.ඩබ්. නිපුන තත්සර
සිව්වන වසර
සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය
nipunwithanage4470@gmail.com

9 772950 655005